සමුපකාර අතිරික්ත අරමුදල - 2019
-------------------------------------

**1.1** මතය වියාචනය
----------------
සමූපකාර අතිරික්ත අරමුදලේ 2019 දෙසැම්බර් 31දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2** මතය වියාචනය සඳහා පදනම
--------------------------------
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත මාගේ මතය වියාචනය කරනු ලැබේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
---------------------------------------------------------------
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්

විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.4,791,681 ක් පිරිවැය වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වෙමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාවිතයේ නොමැති රු.189,001 වූ පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් වශයෙන් ගිණුම් ගත කිරීම | 2020 දෙසැම්බර් 31 දිනට අතිරික්ත අරමුදල සතු සියලු ස්ථාවර වත්කම් නැවත ආගනනයට කමිටුවක් පත්කර ඇත. | ආගනිත වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුයි. |

### 1.5.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සමූපකාර සමිති ණය | 14,680,948 | - | 14,680,948 | සමූපකාර සමිති ණය ලෙජරය හා උපලේඛණයේ පවතින මෙම වෙනස දීර්ඝ කාලයක සිට පැවතෙන වෙනසකි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.5 අවිනිශ්චිත ගිණුම්

| විෂයය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| අවිනිශ්චිත ගිණුම් | 9,475,735 | වර්ෂ 20 | දීර්ඝ කාලයක පටන් පැවත එන මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කර ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ලැබිය යුතු සමුපකාර සමිති ණය | 620,477,724 | ශේෂ සනාථ කිරීම් | මෙම සමිති මගින් ශේෂ සනාථන සඳහා අවස්ථා කිහිපයකදී ලිපි යොමු කළ අතර ඒ සඳහා ලැබුණු ප්‍රතිචාර දුර්වල මට්ටමක පැවතුණි. | ශේෂ සනාථ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | සමුපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | **5,029,486** | ශේෂ සනාථ කිරීම් | දීර්ඝ කාලයක පටන් පැවත එන මෙම ශේෂය නිරවුල් කිරිමට කටයුතු කරමින් පවතී. | ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | පොදු තැන්පත් ගිණුම | **8,411,423** | විස්තරාත්මක උපලේඛනය | කඩිනමින් ඉදිරිපත් කිරිමට නිළධාරීන්ට උපදෙස් ලබා දුනිමි. | උපලේඛන ඉදිරිපත් කිරීමට ක්‍රියාකල යුතුයි. |
| (ඈ) | ස්ථාවර තැන්පත් ඇප ණයහිමියෝ | **58,918,112** | ණය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරිම් | ප්‍රවර්ථන වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරිමේදි නිවැරදි කිරිමට කටයුතු කරමින් පවතී. | ශේෂ සනාථ ඉදිරිපත් කල යුතුයි. |
| (ඉ) | ඇවරගිණුම (හර ශේෂය) | **2,620,473** | පිළියෙල කරන ලද ඇවර ගිණුමේ පිටපතක් | ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරිමට නිළධාරීන්ට උපදෙස් ලබා දුනිමි. | ගිණුම් පිටපත් ඉදිරිපත් කල යුතුයි. |
| (ඊ) | ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | **150,000** | ශේෂ තහවුරු කිරිම් | කඩිනමින් ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කල යුතුයි. |
| (උ) | ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | **3,871,256** | ශේෂ තහවුරු කිරිම් | දීර්ඝ කාලයක පටන් පැවත එන මෙම ශේෂය නිරවුල් කිරිමට කටයුතු කරමින් පවතී. | ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කල යුතුයි. |
| (ඌ) | ලැබිය යුතු භාණ්ඩාගාර අරමුදල | **81,871,370** | ශේෂ සනාථ කිරීම් | කඩනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශේෂ සනාථන ඉදිරිපත් කල යුතුයි. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ වත්කම් යටතේ දක්වා තිබුණු 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,721,566 වූ අගරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | අගරු චෙක්පත් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂපත්‍රයේ විවිධ වගකීම් යටතේ දක්වා තිබූ අතිරික්ත අරමුදලට ගෙවිය යුතු රු.6,017,551 ක්වූ වර්ෂ 30 කට වඩා පැරණි ශේෂය හා එකතුව රු.1,834,392 ක්වූ වගකීම් ගිණුම් 05 ක ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය වසර කීපයක සිට පැවත එන අතර ඒ පිළිබඳ සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.192,948,274 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.204,460,518 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,512,244 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පොළී ආදායම රු.83,211,614 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

----------------------------

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල මගින් සමුපකාර සමිති වෙත ලබා දී තිබුණු ණය මුදල් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුනි. ඒ හේතුවෙන් සමුපකාර සමිති වෙත ලබාදුන් රු.823,971,799 ක මුළු ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.634,531,866 ක් එනම් ලබාදුන් ණය මුදලින් සියයට 77 ක ප්‍රමාණයක් අයවීමට පැවතුණි.තවද, එම ණය ශේෂය මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය පොළිය රු.255,706,442 ක් විය. | එකඟ වෙමි.පළාත් මට්ටමින් ලියාපදංචි කර ඇති සමිති සඳහා ලබාදී ඇති ණය අය කර ගැනිමේ වගකිම පළාත් කොමසාරිස්වරුන් භාර ගැනිමට එකඟතාව පල කර ඇත 2020.වසරේ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ අදාල ඉලක්ක කරා ලගාවිමට නොහැකි විය.කඩිනමින් මෙම ණය පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත පැවරිමට කටයුතු කරනු ඇත. | ණය මුදල අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය වෙත 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.143,919,037 ක් ණය මුදල් වශයෙන් ලබා දී ඇති අතර 2019 දෙසැම්බර් 31 දින වන විට රු.24,891,113 ක් පමණක් අය වී තිබුණි. රු.119,027,924 ක් තවදුරටත් අයවීමට පවතින අතර මෙම ශේෂය වසර 05 සිට 27 දක්වා පැරණි ඒවා විය. | මෙම ණය මුදල් කඩිනමින් ගෙවා අවසන් කරන ලෙස දන්වා යවා ඇති අතර, තවදුරටත් නොගෙවන්නේ නම් නීති මගින් කටයුතු කර ණය මුදල් අයකර ගැනීමට පියවර ගිනිමි. | ණය මුදල අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (ඇ) | කෝප්සිටි සුපිරි වෙළඳසැල් ආරම්භ කිරීම සඳහා 2010 සහ 2011 වර්ෂවලදී රු.12,000,000 ණය මුදල් මෙම අරමුදලින් ගෙවා ඇති අතර ගිවිසුම් ප්‍රකාරව ණය වාරික හා පොලි ගෙවීම ප්‍රමාද කර තිබුණි. මෙම ශේෂ වර්ෂ 8-9 දක්වා පැරණි ශේෂයන් වන අතර 2019 දෙසැම්බර් 31 දිනට රු.9,965,693 ක මුදලක් අයවීමට පැවතුණි. | මෙම කෝප් සිටි සුපිරි වෙළඳ සැල් ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති ණය මුදල් ද කඩිනමින් අයකර ගැනීමට පියවර ගනිමි | ණය අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (ඈ) | 2006 වර්ෂයේ අලෙවි සංගමය වෙත ලබාදුන් රු.19,550,000 ක් වූ ණය මුදල ස්ථාවර තැන්පත් ඇප වශයෙන් ලබාදීමෙන් | මේ සම්බන්ධයෙන් අදාල දෙපාර්ශවයේ තොරතුරු රැස්කර මෙම ණය මුදල | කපා හල මුදලින්ද යන්න තහවුරුවක් ලබාගෙන සුදුසු |

| | | | |
|---|---|---|---|
| | පසු කපාහල මුදලක් බවට සඳහන් වුවද, මේ සම්බන්ධව තහවුරුවක් ලබාගෙන ණය ශේෂය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් 2019 දෙසැම්බර් 31 දක්වාම ගෙන නොතිබුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. | ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට රු.26,037,173 ක ණය ශේෂයක් විවිධ සේවා සමුපාකාර සමිති 34 කින් අයවීමට තිබුණි. මෙම ණය 1989 ත් 2004 වර්ෂයත් අතර කාලය තුලදී ලබා දී තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති මෙම පළාත් විවිධ සේවා සමුපකාර සමිති සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර අයකර ගැනීම් කටයුතු සිදු කිරීමට නිලධාරීන්හට උපදෙස් ලබා දී ඇත. | ණය මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (ඊ) | සී/ස ශ්‍රී ලංකාවේ කුකුලන් ඇතිකරන්නනගේ සමුපකාර සමිති සංගමය 2003 වර්ෂයේදී ලියාපදිංචිය අවලංගු කර ඇවර කටයුතු සඳහා ඇවරකරුවකුද පත් කර තිබුණි. 2012 වර්ෂයෙන් පසු ඇවර කටයුතු නතර වී තිබෙන අතර ඇවර කරුගේ වාර්තාද ඉදිරිපත් වී නැති අතර මේ දක්වා වර්ෂ 08 ක් ගත වී ඇතත් ඇවර කටයුතු අවසන් කර නොතිබුණි. සමුපකාර අතිරික්ත අරමුදලින් මෙම සමිතිය වෙත ලබාදුන් ණය මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.100,000 ක් අයවිය යුතුව තිබුණි. | මෙම සමිතියේ ඇවර කටයුතු අවසන් කර කඩිනමින් මුදල් අයකර ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ණය මුදල අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (උ) | සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමයේ ව්‍යාපාර කටයුතු සඳහා සමුපකාර අතිරික්ත අරමුදලින් රු.18,249,750 ක ණය මුදලක් ලබා දී ඇති අතර එම මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.16,549,750 ක මුදලක් ලැබිය යුතුව පැවතුණි. මේ වන විට සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය අක්‍රිය තත්ත්වයේ පවතී. | මෙම ගොඩනැගිල්ල සඳහා මේ වන විට සී/ස පොළොන්නරුව දිස්ත්‍රික් කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය විසින් හා වෙනත් සමුපකාර ආයතන මගින් ඉල්ලීම් සිදු කර ඇති අතර, ඒ අනුව සලකා බලා සුදුසු ක්‍රියාමාර්ගයකට එළඹ මෙම ණය මුදල් අයකර ගැනීමට පියවර ගනිමින් පවතී. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඌ) | සී/ස කුරුණෑගල ආරෝග්‍යශාලා සමිතිය වෙත 2012 සැප්තැම්බර් 26 දින රු.මිලියන 100 ක් නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ලබා දී තිබු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම ප්‍රමාද කර ඇති අතර 2019 දෙසැම්බර් 31 වන විට | මෙම සමිතියෙන් 2019 වර්ෂයේදී ණය පොලී වාරික වශයෙන් රු.5,000,000 ක මුදලක් ගෙවා ඇති අතර, ඉතිරි හිඟ ණය වාරික ප්‍රමාණයද අයකර ගැනීම සඳහා වයඹ | ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | රු.94,083,304 ක මුදලක් පියවීමට තිබුණි. | පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් දැනුවත් කර ඇත. | |
| (එ) | සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතිය විසින් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් සඳහා රු.4,000,000 ක පොළී රහිත ණය මුදලක් 2014 ජනවාරි 17 දින සමුපකාර අතිරික්ත අරමුදලින් ලබාගෙන තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ණය ගෙවීම සිදු කර නොතිබුණ අතර ණය ලබාගෙන වර්ෂ හයක් ගත වී තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විට රු.1,000,000 ක ශේෂයක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | මෙම සමිතිය විසින් ලබා ගත් ණය මුදලින් මිලියන 03 ක මුදලක් මේ වන විට ගෙවා ඇති අතර තවදුරටත් අයවිය යුතු මුදල මිලියන 01 කි. මුදල් අයකර ගැනීමට වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් පිටපත් සහිතව සමිතිය වෙත ලිපි මගින් දැනුවත් කර තිබුණි. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඒ) | සී/ස ගාල්ල දිස්ත්‍රික්කයේ ආරෝග්‍යශාලා සමුපකාර සමිතිය වෙත 2013 වර්ෂයේදී ලබා දුන් රු.50,000,000 ණය මුදල ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැර හැර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට කිසිදු වාරිකයත් ගෙවා නොතිබු අතර එදිනට ණය ශේෂයට වර්ෂ 06 පැරණිය. | මෙම සමිතියෙන් හිඟ ණය වාරික ප්‍රමාණය අයකර ගැනීම සඳහා වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් වෙත පිටපත් සහිතව ලිපි මගින් දැනුවත් කර ඇති අතර, කඩිනමින් මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ගිවිසුම් ප්‍රකාරව ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුයි |
| (ඔ) | කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියට 2013 හා 2014 වර්ෂයන්හි පිලිවෙලින් ලබාදුන් රු.10,000,000 හා රු.7,000,000 ක මුදලින් රු.15,527,320 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට අයවීමට පැවතුණි. මෙම ශේෂයන් වර්ෂ 06 පැරණිය. | අයකර ගැනිම සඳහා දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් වෙත පිටපත් සහිතව ලිපි මගින් දැනුවත් කර ඇති අතර, කඩිනමින් මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඕ) | සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතියට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් සහ බහුකාර්ය යන්ත්‍රයක් මිලට ගැනීමට 2013 වර්ෂයේදී ලබාදුන් රු.19,500,000 ක ණය මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැර හැර තිබුණි. මේ දක්වා කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබු ණය ශේෂය වසර 06 කට වඩා පැරණිය. | මෙම සමිතියෙන් හිඟ ණය වාරික ප්‍රමාණය අයකර ගැනීම සඳහා වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් රෙජිස්ට්‍රාර් වෙත පිටපත් සහිතව ලිපි මගින් දැනුවත් කර ඇති අතර, කඩිනමින් මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ගිවිසුම් ප්‍රකාරව ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| **(ක)** | සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ව්‍යාපාර කටයුතු සඳහා මෙම අරමුදලින් රු.75,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. ණය ලබාදී වර්ෂ 06 ක් ගත වී ඇතත් තවදුරටත් රු.13,969,497 ක මුදලක් අයවීමට පැවතුණි. | මෙම මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපතිවරයා ලිඛිතව දැනුවත් කර ඇති අතර අමාත්‍යාංශ ලේකම්වරයාද ලිඛිතව දැනුවත් කර ඇත. | අයකර ගැනීමට ක්‍රියාකල යුතුයි. |
| **(ග)** | ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට 2014 වර්ෂයේදී රු.25,000,000 ක ණය මුදලක් ගිවිසුමකට එළඹීමත් තොරව ලබා දී තිබුණි.වර්ෂ 06 ක පමණ කාලයක් ඉක්මවා ගොස් ඇතත් 2019 දෙසැම්බර් 31 දිනට රු.22,119,454 ක මුදලක් අයවීමට පැවතුණි. | මෙම හිඟ ණය මුදල ගෙවා අවසන් කරන ලෙස දැනුවත් කර ඇති අතර 2020 ජූලි 14 දින රු.3,119,454 ක මුදලක් ගෙවා ඇති බව දන්වා ඇත. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුයි |